# අකීකරු ලේන් පැටියා



තිනුලි තුහන්සා

කෘතියේ නම - අකීකරු ලේන් පැටියා

කතෘගේ නම - තිනුලි තුහන්සා ජයසුන්දර

කතෘ අයිතිය ඇතුළු විස්තර - 2 ශ්‍රේණිය D පන්තියේ ඉගෙනුම ලබන තිනුලි තුහන්සා ජයසුන්දරගේ කෘතියකි

කෘතිය පළකරන දිනය - 2025/02/08

ISBN978-624-208-288-2

# පිදුම

මාගේ ආදරණීය

දෙමාපියන්ටත්

සිප් සතර කියාදුන්

ගුරුමෑණිවරුන්ටත්

මෙම පොත පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

## අකීකරු ලේන් පැටියා

ඔන්න එකෝමත් එක ගමක ලොකු ගසක් උඩ ලේන් අම්මා කෙනෙකුයි ලේන් පැටියෙකුයි හිටියා. මේ දෙන්නා ගොඩක් සතුටින් ජීවත් වුණා.




ඔන්න එක දවසක් මේ දෙන්නට ගොඩාක් සීතල දවසක් වුණා. මේ දෙන්නට ගොඩක් ලොකු බඩගින්නක් ආවා ඉතින් ලේන් පැටියා කිව්වා. "අම්මේ මට හරිම බඩගිනි"



ඉතින් ඒක අහපු ලේන අම්මාට ගොඩක් දුක හිතුණා. ලේන් අම්මා ලේන් පැටියට කිවුවා. "අනේ මගේ පැටියෝ මම ඉක්මණට ගිහින් කන්න මොනවා හරි හොයන් එන්නම්, මම කෑම හොයා ගෙන එනකම් ඔයා කොහෙවත් යන්න බෑ" ලේන් අම්මා කිවුවා.



ඔන්න ඉතින් ලේන් අම්මා ලේන් පැටියා ගැන හිත හිතා කෑම හොයන්න පටන් ගත්තා. “අනේ මගේ පැටියට ගොඩක් බඩගිනි ඇති, ඉක්මණට කෑම හොයාගන යන්න ඕන”



ලේන් අම්මා කෑම හොයන්න ගිය වෙලාවේ ලේන් පැටියා "මම අම්මා එනකම් ගහෙන් බැහැලා සෙල්ලම් කරන්න ඕනෑ " කියලා හිතුවා "අම්මා යන්න එපා කියලා කිවුවා,ඒ වුණාට මට සෙල්ලම් කරන්න ඕනෑ." ලේන් පැටියා ගහෙන් බහින්න පටන් ගත්තා.



අනේ ඉතින් ලේන් පැටියා ගහෙන් බහින්න යටකොට එතන තිබුණු ගඟට වැටිලා ගහගෙන ගියා.



"අනේ අම්මේ මාව බේර ගන්නකෝ"ලේන් පැටියා කෑගැසුවා.ලේන් අම්මා කෑම හොයාගෙන කූඩුවට ආවා. ලේන් අම්මා වටපිට බැලුවා.ලේන් පැටියා කොහේවත් නෑ. ලේන් අම්මා හයියෙන් කෑගසමින් ලේන් පැටියාව හොයන්න පටන් ගත්තා.



ලේන් අම්මා හයියෙන් කෑගහගහ දුවන්න පටන්ගත්තා. ලේන් අම්මාගේ සද්දේ ඇහිලා එතනින් ගිය ඉබිරාල "මොකද මොක ද ලේන් අම්මේ මෙච්චර කළබල වෙලා" "අනේ ඉබිරාල මගේ පැටියා කූඩුවේ නැහැ,අනේ මට එයාව හොයාගන්න උදවු කරන්න" ලේන් අම්මා කිව්වා.



ඉතින් දෙන්නම එකතු වෙලා පැටියව හොයන්න පටන් ගත්තා. ලේන් අම්මාට එකපාර ම ගඟ පැත්තෙන් කෑගහන  සද්දයක් ඇහුණා. “අනේ අම්මේ මාව බේර ගන්න” ලේන් අම්මා ඉක්මණට ඉබිරාලත් එක්ක ගඟ ළඟට ගියා.ලේන් අම්මා දැක්කා ලේන් පැටියා ගඟේ ගහගෙන යනවා.



"ලේන් අම්මේ කළබලවෙන්න එපා. මම පැටියව ඉක්මණට බේරගෙන එන්නම්" කියලා ඉබිරාල ගඟට පැන්නා.

ගඟට පැනපු ඉබිහාමි ලේන් පැටියව පිටේ තියාගෙන පීනගෙන ගොඩට එන්න පටන් ගත්තා.

ඉතින් ඉබිරාල මහන්සියෙන් ලේන් පැටියවත් පිටේ තියාගෙන ලේන් අම්මා ළඟට පීනගෙන පීනගෙන ඇවිත් ලේන් පැටියව අම්මට දුන්නා.



ලේන් අම්මා ලේන් පැටියාගෙන්  ඇහුවා "ඇයි පැටියෝ මම ඔයාට කිව්වානේ,මම එනකම් කොහෙවත් යන්න එපා කියලා." ලේන් අම්මා ලේන් පැටියව තුරුළු කරන් අඬන්න පටන් ගත්තා.

ලේන් අම්මායි,ලේන් පැටියයි අඩන දිහා ඉබ්හාමි බලන් ඉදලා මෙහෙම කිවුවා "ලේන් පැටියෝ ඔන්න ඕකතමයි කියන්නේ වැඩිහිටියන් කියනදේට කීකරු වෙන්න කියලා."



ඔන්න ඉතින් ඉබිහාමි කියපු ඒ කතාව අහලා ලේන් පැටියා ලේන් අම්මාගෙන් සමාව ගත්තා. "අනේ අම්මේ මට සමාව දෙන්න, මම ආයේ අකීකරු වෙන්නේ නැහැ " ඊට පස්සේ ලේන් අම්මයි ලේන් පැටියයි ඉබිහාමිට ස්තූති කරලා සතුටින් කූඩුවට ගියා.

නිමි.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්